# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
*Web: www.elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත, රාජගිරිය(10107)
தேர்தல் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)
*e-mail: info@elections.gov.lk*

| | | |
|---|---|---|
| මගේ අංකය: EC/EDR/LAE/2025/04 | ඔබේ අංකය: | දිනය : 2025.03. 11 |
| எனது இல. : | உமது இல.: | திகதி : |

**චක්‍රලේඛ අංක - LAE/2025/07**

**සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025**
**දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම අදාළව 2025.03.17 දින සිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර සතියක කාලයක් ගතවන තෙක් ක්‍රියාත්මකවන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දී දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය බැගින් පිහිටුවිය යුතු ය. මෙම දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් හා නියෝග ලබාදීමට දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ උපදේශක කමිටුවක් පිහිටුවිය යුතු ය. එකී උපදේශක කමිටුව සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී, නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් සහ දිස්ත්‍රික් නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඇතුළත් විය යුතු ය.

02. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට විවිධ පාර්ශ්ව විසින් ඡන්ද විමසීම් නීති උල්ලංඝණය කිරීමක් හෝ ඡන්ද විමසීම් කටයුතුවලට බාධා ඇති කිරීමක් පිළිබඳව යොමු කරන පැමිණිලි සඳහා කඩිනමින් ක්‍රියා කළ යුතු ය. එසේ යොමු කරන පැමිණිලි නිසි පරිදි කළමනාකරණය කර නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති වන බාධා වළකාලීමටත් ඒවා තවදුරටත් ඇති වීමට ඉඩ නොදීමටත්, ඡන්ද විමසීම නීත්‍යානුකූලව පැවැත්වීමට හා පැමිණිලිවලට අදාළ සිද්ධීන්ගෙන් අගති සිදුවන පාර්ශ්වයන්ට සහන සැලසීමත්, තරග කරනු ලබන පාර්ශ්වයන්ට සම අවස්ථා ලබාදීමත් යන කටයුතු සිදු කිරීම මෙම දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රධාන අරමුණ ලෙස සැලකිය යුතු ය.

03. පහත සඳහන් උපදෙස් පරිදි මෙම දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පවත්වාගෙන යා යුතු ය.

### 3.1 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම හා කාර්යාල පහසුකම්

3.1.1 දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ එකඟතාවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ හඳුනාගත් ස්ථානයක මෙම මධ්‍යස්ථානය පිහිටුවීමටත්, ඊට අවශ්‍ය කාර්යාල පහසුකම් තාවකාලිකව ලබාදීමටත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් කටයුතු කළ යුතු ය. මේ සඳහා අලුතෙන් කාර්යාල උපකරණ මිලදී ගැනීමෙන් වැළකීම සුදුසු ය. කෙසේ නමුත් නොවැළැක්විය හැකි හේතුවක් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් බැහැර වෙනත් ආසන්න ස්ථානයක මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව පූර්වයෙන් ලබාගත යුතු ය.

3.1.2 මෙම කාර්යාලය සඳහා තාවකාලිකව දුරකථන හා ෆැක්ස් පණිවිඩ පහසුකම් ද සැලසිය යුතු ය. මෙම දුරකථන හා ෆැක්ස් අංක මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා නොපමාව මැතිවරණ කොමිෂන් සභාව වෙත දැන්විය යුතු ය. (2025.03.14 දිනට පෙර අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති) වෙත එවිය යුතු ය.)

3.1.3 රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකු වන සහකාර තේරීම්භාර නිලධාරියකු යටතේ මෙම මධ්‍යස්ථානය පවත්වා ගෙන යා යුතු අතර, ඔහුගේ සහායට තවත් සහකාර තේරීම්භාර නිලධාරියෙකු හෝ දෙදෙනෙකු (තවමත් රාජ්‍ය සේවයේ සිටින හෝ නැවත සේවයට බඳවාගත්) ද සහකාර පොලිස් අධිකාරිවරයකු හෝ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් පොලිස් ඒකකයක් ද රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී පළමුවන පන්තියේ නිලධරයකු හා එකී සේවයේ හෝ සමාන්තර සේවයක හෝ තවත් නිලධරයකු ද කාර්යාල කාර්ය සහායකයකු ද මෙම කාර්යාලයට අනුයුක්ත කළ යුතු අතර, එකී කාර්ය මණ්ඩලයේ විස්තර ද EDR/24/F-1 ආකෘතිය මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා එවිය යුතු ය. ලැබෙන පැමිණිලි සංඛ්‍යාව /දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව හා විශාලත්වය/ඒ ඒ පළාත් පාලන ආයතන සංඛ්‍යාව/ තරග කරනු ලබන පක්ෂ/ අපේක්ෂක සංඛ්‍යාව වැනි කරුණු සලකා බලා මෙම ඒකකයට අනුයුක්ත කළ යුතු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ප්‍රමාණය තීරණය කළ හැකි ය. එසේ වෙනස්කම් සිදුකරන්නේ නම් ඒ බව පූර්වයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැන්විය යුතු ය. පොලිස් නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සඳහා අදාළ වන පරිදි පළාතේ/ දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් සමඟ සාකච්ඡා කිරීම යෙහෙකි.

3.1.4 මෙම මධ්‍යස්ථානයේ විෂයභාර මාණ්ඩලික නිලධාරීන්ට හා පොලිස් නිලධාරීන්ට පැමිණිලි සම්බන්ධ පරීක්ෂණ කටයුතු සඳහා ක්ෂේත්‍රයේ ගමන් කිරීමට වාහන හා ඒ සඳහා ඉන්ධන ද ලබාදිය යුතු වේ.

3.1.5 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් සැපයිය යුතු වේ.

3.1.6 දිනපතාම පෙරවරු 8.00 සිට අවම වශයෙන් පස්වරු 8.30 දක්වා මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය විවෘතව තැබිය යුතු අතර, ඡන්ද විමසීම් දිනට දින දෙකකට පෙර සිට ඡන්ද විමසීම අවසන්ව සති දෙකක් වන තෙක් වූ මුළු කාලය තුළ මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව විවෘතව තැබීමට වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ය. ලැබෙන පැමිණිලි ප්‍රමාණය, වාර ගණන සහ ප්‍රදේශයේ පවතින වාතාවරණය සලකමින් කාර්යාල වේලාව දීර්ඝ කිරීම සඳහා වන නිර්දේශ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී මගින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම කළ යුතු ය.

3.1.7 ඡන්ද විමසීම් කාල සීමාව තුළ ප්‍රාදේශීය මට්ටමින් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන විවෘත කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, එම පිහිටුවීම් සම්බන්ධයෙන් වන තොරතුරු අදාළ මධ්‍යස්ථාන ස්ථාපිත කළ වහාම මැතිවරණ කොමිෂන් සභාව වෙත උපදෙස් දෙන ලෙසත් දන්වා සිටිමි. මෙහිදී එම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා වැයවන පිරිවැය පිළිබඳ අවධානය යොමු කළ යුතු අතර, ප්‍රවාහන හා නවාතැන් වියදම් අවම වන පරිදි එම මධ්‍යස්ථානයට ආසන්නයේ සේවය කරන නිලධාරීන් යෙදවීමට කටයුතු කිරීම වඩා සුදුසු වේ. තවද, මෙසේ යොදවන නිලධාරීන් අදාළ ප්‍රදේශය පිළිබඳ මනා අවබෝධයකින් යුතු නිලධාරීන් වීම, අරමුණු ගත කාර්යය වැඩි කාර්යක්ෂමතාවකින් හා ඵලදායීව ඉටු කර ගැනීමට ඉවහල්වනු ඇත.

3.2 **පැමිණිලි භාරගැනීම**

3.2.1 ඕනෑම අයෙකුට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව/ තේරීම්භාර නිලධාරී වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකිවන අයුරින් මෙම ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා තිබිය යුතු ය. පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා EDR/25/F-2 ආකෘතිය ඉල්ලා සිටින පැමිණිලිකරුවන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. දුරකථන මගින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි, පැමිණිලිකරුගේ අනන්‍යතාව ද සමඟ (අනන්‍යතාව ලබාදීමට කැමති නම්) ඉහත ආකෘතියෙහි සටහන් කර ගැනීමට කටයුතු කළ යුතු ය. පැමිණිල්ලක්, ෆැක්ස් පණිවිඩයක් මගින් ඉදිරිපත් කිරීම සඳහා කරුණු විමසන අයට සිය අනන්‍යතාව පිළිබඳ අදාළ විස්තර ද සමඟ ඒවා ඉදිරිපත් කරන ලෙස උපදෙස් දිය යුතු ය. සෑම විටම ෆැක්ස් පණිවිඩයක් වශයෙන් ලැබෙන පැමිණිලි, එහි ඡායා පිටපතක් ද සමඟ ගොනු කළ යුතු ය. පැමිණිලි පහසුවෙන් හඳුනා ගැනීම සඳහා සුදුසු පරිදි අංක 01 සිට පිළිවෙල අංක යෙදිය යුතු ය.

3.2.2 සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා අතුරින් ඕනෑම භාෂාවකින් පැමිණිලි ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතු ය. එබැවින් දිස්ත්‍රික් ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට නිලධාරීන් තෝරා ගැනීමේ දී මෙම අවශ්‍යතාව සම්පූර්ණ වීම කෙරෙහි ද අවධානය යොමු කිරීම මැනවි.

3.2.3 භාරගත් පැමිණිලි හා ඒවා සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ මෙහි පසුවට දන්වා ඇති ආකාරයට විස්තර තබාගත යුතු අතර, එම තොරතුරු මැතිවරණ කොමිෂන් සභාව වෙත දිනපතා සාරාංශයක් ලෙස එවීම සඳහා අවශ්‍ය ආදර්ශ ආකෘතියක් මේ සමඟ එවා ඇත. සෑම දිනකම මධ්‍යහ්න 12.00 වන විට ලැබී ඇති පැමිණිලි අනුව (EDR/25/F-3-A, EDR/25/F-3-B) මෙම ආකෘතිය සම්පූර්ණකර WhatsApp අංක 070-5396999 මගින් ද මෘදු පිටපත (Excel/ Word) electionedr@gmail.com වෙත සෑම දිනකම ප.ව.3.00 වන විට 24 පැය වාර්තාවක් ලෙස ද email කිරීමට කටයුතු කරන්න. මේ සම්බන්ධයෙන් සකස් කළ පරිගණක වැඩසටහන ද මෙයටම සමගාමීව ක්‍රියාත්මක වන බව සැලකුව මැනවි.

3.2.4 මැතිවරණ වියදම් නියාමනය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට හෝ දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකවලට ලැබෙන පැමිණිලි ඡන්ද විමසීම අවසාන වනතුරු වෙනම ගොනු කර තැබීමට කටයුතු කළ යුතු ය.

3.3 **පැමිණිලි පරීක්ෂාව හා ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම**

3.3.1 නීත්‍යානුකූලව පවත්වනු ලබන රැස්වීමකට යම් පාර්ශ්වයකින් බාධා ඇති වන බවට පැමිණිල්ලක් ලද හොත් එම රැස්වීම් පවත්වන ස්ථානය අයත් පොලිස් වසමේ පොලිස් ස්ථානාධිපතිවරයාට සුදුසු පියවර ගැනීම සඳහා එබඳු පැමිණිලි යොමුකොට ඒ පිළිබඳ පසු විපරම් කිරීමට ද වගබලා ගත යුතු ය. තවද රැස්වීම් සඳහා ක්‍රීඩා පිටි, භූමි ප්‍රදේශ, ගොඩනැගිලි හෝ රැස්වීම් ශාලා වෙන් කරවා ගැනීමේ දී ඇතිවන ගැටළු සම්බන්ධයෙන් ද පැමිණිලි ඉදිරිපත් විය හැකි බැවින් එවැනි අවස්ථාවල දී ද එම දේපළ අයත් අදාළ ආයතන වෙතින් කරුණු සොයා බලා රැස්වීම් පැවැත්වීම සඳහා අපේක්ෂා කරන පාර්ශ්වයට අසාධාරණයක් නොවන පරිදි සහන ලබා දීමට ක්‍රියා කළ යුතු ය.

3.3.2 නීත්‍යානුකූල නොවන දැන්වීම් ප්‍රදර්ශනය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව ඒවා ප්‍රදර්ශනය වන ප්‍රදේශවල පොලිස් නිලධාරීන් දැනුම්වත් කොට එවැනි දෑ අප්‍රමාදව ඉවත් කරවීමට පියවර ගත යුතු ය.

3.3.3 නීත්‍යානුකූල නොවන මැතිවරණ ප්‍රචාරණ කාර්යාල හෙවත් ඡන්ද කාර්යාල පිහිටුවා ඇති බවට පැමිණිල්ලක් ලද හොත් අදාළ කාර්යාලය පිළිබඳව ඡන්ද විමසීම් නීතිය අනුව දැනුම් දිය යුතු තැනැත්තා විසින් තේරීම්භාර නිලධාරීට හා ඡන්ද කාර්යාලය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම් දී ඇත්දැයි සොයා බැලිය යුතු ය. (එසේ දැනුම් දීමෙන් පසු ලබා දෙන අවසර දීමේ ලේඛනය එම කාර්යාලය තුළ ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.) එසේ දැනුම් දීමකින් තොරව නීත්‍යානුකූල නොවන අන්දමට එවැනි කාර්යාල පිහිටුවා ඇත්නම් ඒවා මෙම

මධ්‍යස්ථානයේ හා අදාළ පොලිස් බල ප්‍රදේශයේ පොලිස් නිලධාරීන් යොදවා වසා දැමීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය.

3.3.4 අවශ්‍ය පරිදි ක්ෂේත්‍රකාර්යය සඳහා පොලිස් නිලධාරීන් හා දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් යෙදවිය යුතු ය. එවැනි කටයුතු සඳහා ක්ෂේත්‍රයට යැමට අවශ්‍ය විශේෂිත කරුණු ඇත්නම් ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව වෙත හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත වාර්තා කළ විට දී සුදුසු උපදෙස් නිකුත් කරනු ඇත. එසේ වුවද නීත්‍යානුකූල නොවන දැන්වීම් ප්‍රදර්ශනය, අනවසර ප්‍රචාරණ කාර්යාල පවත්වාගෙන යාම, රාජ්‍ය දේපළ අයුතු පරිහරණය, රථවාහන පෙළපාළි, අයුතු ජනරාශි වීම් හෝ එවැනි වෙනත් නීත්‍යානුකූල නොවන කාර්යයන් සිදුවේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා මධ්‍යස්ථානයේ හෝ මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් ද නිරතුරුවම ක්ෂේත්‍ර නිරීක්ෂණවල යෙදීම අත්‍යවශ්‍යය. එමෙන්ම නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්, වෙනත් මාණ්ඩලික නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, දේශපාලන හා සිවිල් සමාජ ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන්, පුරවැසියන් හරහා මැතිවරණ නීති උල්ලංඝණය වීම් පිළිබඳ තොරතුරු ලබා ගත යුතු වේ. තවද නියෝජ්‍ය/ සහකාර ඡන්ද විමසීම් කොමසාරිස්වරුන් ද හැකි අවස්ථාවන්හි දී අනවසර ප්‍රචාරණ හා නීති උල්ලංඝණය වීම් සිදු වන්නේ ද යන්න පිළිබඳව නිරීක්ෂණ කිරීම් සඳහා කාර්යාලයෙන් බැහැරව ස්වකීය දිස්ත්‍රික්කයේ සැරිසැරීම අවශ්‍ය වේ. නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්, එනම් මැතිවරණ කොමිෂන් සභාවේ සෘජු නියෝජිතයන්, ක්ෂේත්‍රයේ නිරීක්ෂණවල නිරත වෙමින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අවැසි වාතාවරණය පවත්වා ගැනීමට ක්‍රියා කරන බව දේශපාලනඥයින්ට/ පුරවැසියන්ට/ උනන්දුවක් දක්වන පාර්ශ්වවලට ඒත්තු යනු ඇත.

3.3.5 රජයේ සම්පත් ඡන්ද විමසීමේ දී පක්ෂ/ අපේක්ෂකයන්ගේ ප්‍රචාරණ හා අනිකුත් කටයුතු වෙනුවෙන් යම් පාර්ශ්වයක් විසින් භාවිතා කරනු ලබන බවට පැමිණිලි ලද හොත් ඒ පිළිබඳ සොයා බලා එහි සත්‍යතාවක් ඇත්නම් වහාම එම අනිසි සම්පත් පරිහරණය වළකාලීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගත යුතු ය. යම් විශේෂිත සිද්ධියක් වාර්තා වූ විට දී ඒ පිළිබඳව හා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව කඩිනමින් ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය වෙත දුරකථනයෙන් දැනුම්දීම අත්‍යවශ්‍යවේ.

3.3.6 ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළ නියෝජිතයින්ට හෝ පිළිගත් මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වලට ඔවුන්ගේ කටයුතු කරගෙන යාමට බාධාවන ආකාරයේ සිදුවීමක් පිළිබඳව ලිඛිතව හෝ වාචිකව වාර්තා වුවහොත්, නොපමාව එම බාධා ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු ය. තවද මෙවැනි සිද්ධි හා ඒ පිළිබඳව ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී සහ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම්වත් කිරීමට මෙම මධ්‍යස්ථානය භාර නිලධාරීන් විසින් කටයුතු කළ යුතු ය. ඡන්ද පොළ නියෝජිතයින් බියවද්දා ඡන්ද පොළකින් එලවා දැමීම වැනි කරුණු ඡන්ද විමසීම් නීතිය යටතේ ඡන්ද විමසීම ශුන්‍ය කිරීමට පවා හේතු විය හැකි බැවින්, විශේෂයෙන් මෙවැනි පැමිණිලි සම්බන්ධව අප්‍රමාදව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

3.3.7 ඡන්ද පොළක් තුළ හෝ ඒ ආසන්නයේ ඉහතකී සිද්ධි සිදුවන බවට වාර්තා වුවහොත් වහාම ඒ සම්බන්ධව සුදුසු පියවර ගැනීමට ප්‍රාදේශීයව පිහිටුවා ඇති වඩාත් ළඟම සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට හා අදාළ කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරියාට ද දැනුම් දිය යුතු ය. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් අදාළ ප්‍රදේශයට ගොස් කටයුතු කිරීමට සැලකිය යුතු කාලයක් ගතවන බැවින් එබඳු පැමිණිල්ලක් ලැබුණු වහාම ඡන්ද විමසීමේ දින හා ඊට පෙර දින සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම ස්ථාපිත කෙරෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථාන මගින් ඉහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීම වඩාත් ප්‍රායෝගික වේ. මෙවැනි අවස්ථාවකදී අදාළ පොලිසිවලට හා ජංගම පොලිස් ඒකකවලට දන්වා ඡන්ද විමසීම යථා තත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු ය.

3.3.8 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී හා කරුණු වාර්තා කිරීමේ දී ඡන්ද විමසීම නීතියට අනුව ඒවා සිදු කළ යුතු බවට මැතිවරණ කොමිෂන් සභාව විසින් පොලිස් නිලධාරීන් දැනුවත් කර තිබුණ ද මෙම මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරීන් ද ඒ සම්බන්ධව විශේෂයෙන් දැනුම්වත් කිරීම වඩාත් සුදුසු වේ.

3.3.9 ඔබ විසින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 77 වගන්තියේ සිට 82 දක්වා වූ වගන්ති පිළිබඳව නිසි අවබෝධයක් නිලධාරීන්ට ලබා දිය යුතු ය. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 හා 104 වගන්ති පිළිබඳ මනා අවබෝධයක් ලබා දිය යුතු ය. තවද මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද විධාන, උපමාන හා ආචාර ධර්ම පිළිබඳව ද ඔවුන් දැනුම්වත්ව සිටිය යුතු ය.

**3.4 තරග කරනු ලබන දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ට හා නියෝජිතයින්ට දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානවල කටයුතු පිළිබඳව තොරතුරු ලබා දීම.**

3.4.1 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවන අවස්ථාවේ දී මෙම වැඩපිළිවෙලේ අරමුණු සහ එම මධ්‍යස්ථානයේ කටයුතු සම්බන්ධව පක්ෂ හා අපේක්ෂකයන් නම් කරනු ලබන නියෝජිතයන් දැනුම්වත් කළ යුතු අතර, ලැබුණු පැමිණිලි හා ඒවා සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග සම්බන්ධව දැනුම්වත් වීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු ය.

3.4.2 අදාළ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අපේක්ෂකයන් ඔවුන්ගේ නියෝජිතයන් මගින් ඉදිරිපත් කරනු ලබන යෝජනා, පැමිණිලි හා විවේචන කෙරෙහි සැලකිලිමත් වීම උචිත ය.

3.4.3 ප්‍රාදේශීය මට්ටමින් මෙම කාර්යාල පිහිටුවීම පිළිබඳව ද ඡන්ද විමසීමට ආසන්නයේ අවශ්‍යතාවය මත පිහිටවනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථාන පිළිබඳව ද දැනුම්වත් කළ යුතු ය.

04. යම් බල ප්‍රදේශයක ඡන්ද විමසීම ශූන්‍ය කිරීමට හේතුවන සිද්ධි ඇති නොවීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණයක් ඇති කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ හා රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම බැවින් මෙවැනි සිද්ධි ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය සියලු දැනුම්වත් කිරීම් හා පූර්වෝපායන් යෙදවීමට කටයුතු කළ යුතු ය. ඡන්ද විමසීම් පනතේ විධිවිධාන අනුව හා මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇති ආකාරයට මෙවැනි සිද්ධියක් වාර්තා වූ විගස තේරීම්භාර නිලධාරී, නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම්වත් කිරීමටත් ඔවුන්ගේ උපදෙස් පරිදි ක්‍රියා කිරීමටත් දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් කටයුතු කළයුතු වේ. පැමිණිල්ලේ සත්‍යතාවක් ඇත්නම් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

**05. ලේඛන පවත්වාගෙන යාම**

5.1 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට ලැබෙන සියලු පැමිණිලි මැතිවරණ පැමිණිලි කළමනාකරණ මෘදුකාංගය වෙත ඇතුළත් කිරීමෙන් අනතුරුව ස්වයංක්‍රීයව ජනණය වන අනු අංකය යටතේ ලියාපදිංචි කළ යුතු අතර, ඒ අනුපිළිවෙලින් ගොනු කර පවත්වා ගත යුතු ය.

5.2 පැමිණිලි සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීමට පහත සඳහන් තොරතුරු ඇතුළත් ලේඛනයක් (සී. ආර්.පොතක්) නඩත්තු කළ යුතු ය. පරිගණක දත්ත පද්ධතියක් / වැඩසටහනක් මෙ සඳහා භාවිතා කරයි නම් එහි ඇතුළත් කරන දත්තයන්හි වාර්තාවක් සෑම පැය 4කට වරක්වත් මුද්‍රණය කොට ගොනුගත කර ගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුම්වත් කරන්න.

I. පිළිවෙල අංකය
II. පැමිණිල්ල ලද දිනය හා වේලාව (පැමිණිලිවල දින මුද්‍රාව තිබිය යුතු ය.)
III. පැමිණිලිකරුගේ විස්තර (නම, ලිපිනය, දුරකථන අංකය, නියෝජනය කරන පක්ෂයක් හෝ කණ්ඩායමක් තිබේ නම්)
IV. පැමිණිල්ල කුමන කරුණකට අදාළව ද යන බව සැකෙවින්
V. පැමිණිල්ල සම්බන්ධව දැනුවත් කළ පාර්ශ්ව (දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/ සහකාර මැතිවරණ කොමසාරිස්/ ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති/ ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරී/ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලය ආදිය)
VI. පැමිණිල්ල සම්බන්ධව ගත් පියවර හා ඇති වූ ප්‍රතිඵල
VII. වෙනත් කරුණු
VIII. තොරතුරු සටහන් කළ නිලධාරියාගේ අත්සන හා නම

5.3 දුරකථනයෙන් / ෆැක්ස් මගින් හෝ වාචිකව ලැබෙන පැමිණිලි සඳහා තොරතුරු වාර්තා කිරීමට EDR/25/F-4 ආකෘතිය සහ සෑම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන්ම තොරතුරු වාර්තා කිරීමට EDR/25/F-5 අකෘතිය භාවිතා කරන්න. වාර්තා වන සෑම ප්‍රචණ්ඩ ක්‍රියාවක් සම්බන්ධයෙන්ම සම්පූර්ණ කළ ආකෘතිය වාර්තා වූ දිනටම WhatsApp අංක 070-5396999 මගින් ජාතික මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය වෙත එවීමට කටයුතු කරන්න. (EDR/25/ CAT) - පැමිණිලි වර්ග)

5.4 මෙම මධ්‍යස්ථානයේ නඩත්තු කරන ලද සියළුම ලිපි ලේඛන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ රාජකාරී නිමාකොට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට දන්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට නිසි පරිදි භාරදීමට මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරියා විසින් කටයුතු කළ යුතු වේ.

## 06. මැතිවරණ ආරවුල් පිළිබඳ පැමිණිලි යොමුකිරීමේ පරිගණක වැඩසටහන

මැතිවරණ ආරවුල් කළමනාකරණ ක්‍රියාවලියේ දී යොමුවන පැමිණිලි භාරගැනීම හා එම පැමිණිලි ඒ සඳහා ක්‍රියාත්මක විය යුතු නිලධාරීන් වෙත ක්‍රමවත්ව හා කාර්යක්ෂමව යොමු කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන් අතරින් කවර හෝ මාධ්‍යයකින් ලැබෙන පැමිණිලි මෙම වැඩසටහනට ඇතුළත් කිරීමේ හැකියාව පවතී. ඒ අනුව පරිගණක හැසිරවීමේ හැකියාව හා දත්ත ඇතුළත් කිරීමේ හැකියාව ඇති, නිලධාරියෙකු විසින් දත්ත ඇතුළත් කිරීමෙන් පසු අදාළ පැමිණිල්ලේ ස්වභාවය පරිදි අයත්වන කාණ්ඩය අනුව වර්ග කිරීමෙන් අනතුරුව නිසි අයවලුන් වෙත එම පැමිණිල්ල යොමු කිරීම මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයේ සහකාර තේරීම්භාර නිලධාරී විසින් සිදු කළ හැකි වන පරිදි මෙම පරිගණක වැඩසටහන සකස්කර ඇති අතර, අදාළ පැමිණිල්ල පිළිබඳව අවශ්‍ය පියවර ගෙන තිබේද යන බවද එමගින් පරීක්ෂා කිරීමේ හැකියාව ද අදාළ නිලධාරියා සතු ය. මෙම වැඩසටහන භාවිතා කිරීමේ පහසුව සඳහා දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරීන්ට පුහුණුවක් ලබා දෙන අතර පැමිණිලි තොරතුරු ඇතුළත් කිරීමේ දී පොලිස් වසම් හා පොලිසියට අදාළ අනෙක් තොරතුරු හඳුනාගැනීමේ දුෂ්කරතා ඇතිවන්නේ නම් එවැනි අවස්ථාවල දී දිස්ත්‍රික්කයේ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පොලිස් නිලධාරීන්ගේ සහය ඔබ වෙත ලබා දෙන ලෙස ඔවුන් ද දැනුම්වත් කර ඇත.

මෙවර මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට පැමිණිලි යොමුකිරීම සඳහා ජංගම යෙදවුමක් (mobile App) හඳුන්වා දීමට නියමිත බැවින් එම ජංගම යෙදවුම (mobile App) මත පදනම්ව පැමිණිලි ලබා ගැනීමෙන් ඒවා පොලිස් කොට්ඨාසවලට යොමු කිරීමටත් එම පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය සොයාබැලීමටත් ඔබ දිස්ත්‍රික්ක තුළ ඒ සඳහා පුහුණුකල නිලධාරීන් ඔවුන්ට අවශ්‍ය උපකරණ ලබා දී යොමු කළ යුතු ය.

07. වෙනත් කරුණු

7.1 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානවලට අදාළ කටයුතු විධිමත් කිරීම සඳහා, දිස්ත්‍රික් මට්ටමින් තව දුරටත් ගත හැකි සුදුසු පියවර ද ගෙන මෙම කාර්යය ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාම මගින් ඡන්ද විමසීම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් වැඩිදුරටත් දැනුම් දෙමි. රාජ්‍ය දේපල අයුතු පරිහරණය පිළිබඳ විධාන ඇතුළත් ගැසට් පත්‍රයක් ඉදිරියේ දී ඔබ වෙත එවනු ඇත. ඒ සම්බන්ධයෙන් ද අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීම යෙහෙකි. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි දිස්ත්‍රික්කය තුළ දී නිරාකරණය කර ගැනීමට නොහැකි අවස්ථාවල දී පමණක් කොමිෂන් සභාවේ ජාතික මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කිරීම වඩාත් සුදුසු ය. එමෙන්ම පැමිණිලි විමර්ශනය කිරීමේ දී නැතහොත් නීති විරෝධී ප්‍රදර්ශන/ කාර්යාල ඉවත් කරවීමේ දී සැමවිටම අපක්ෂපාතීව, ද්වේශයෙන් හා පූර්ව නිගමනවලින් තොරව ආචාරශීලීව නිත්‍යානුකූලව ක්‍රියා කළ යුතු අතර, අදාළ පාර්ශ්වවල ආත්ම ගෞරවයට හානිවන අයුරින් ක්‍රියා නොකිරීමට වගබලා ගත යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කළ යුතු ය.

7.2 එසේම ඔබගේ දිස්ත්‍රික්කයට හෝ ඒ ඒ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයට විශේෂිත වූ කරුණු සම්බන්ධව තොරතුරු විමසීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති) අමතන්න.

ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| දුරකථන අංකය | - **011-2868471** |
| | - **011-2868153** |
| ෆැක්ස් අංකය | - **011-2868153** |
| | - **011-2868153** |
| **WhatsApp** | - **070-5396999** |
| **E-mail** | - **electionedr@gmail.com** |

…………………………

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**

පිටපත්:-

1. පොලිස්පති (වැ.බ.) - දැන ගැනීම පිණිස හා ඉහත 3.1.3 ඡේදයේ දැක්වෙන මැතිවරණ පැමිණිලි ආරවුල් කළමනාකරණ දිස්ත්‍රික් මධ්‍යස්ථාන සඳහා පොලිස් නිලධාරීන් අනුයුක්ත කිරීමට අවශ්‍ය උපදෙස් කඩිනමින් නිකුත් කිරීමට කාරුණික වනු පිණිස.
2. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානවලට අනුයුක්ත සහකාර තේරීම්භාර නිලධාරීන් - මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා

*පසු සටහන-*

1. **මෙහි පිටපත් තරග කරනු ලබන දේශපාලන පක්ෂ ලේකම්වරු/ ස්වාධීන අපේක්ෂකයින්/ නායකයන් වෙත හා දිස්ත්‍රික් බලයලත් නියෝජිතයන් වෙත ද යවනු ලැබේ.**
2. **දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ කමිටුව මාර්ගයෙන් කළමනාකරණ මධ්‍යස්ථානයට ලැබෙන පැමිණිලි අතරින් ප්‍රතිපත්තිමය තීරණ ගතයුතු බව පෙනී යන හෝ මෙම ඡන්ද විමසීමට අදාළව පූර්වයෙන් උපදෙස් ලබා නැති සිද්ධි හෝ පැමිණිලි පිළිබඳව ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ කමිටුව වෙත හා කොමිෂන් සභාව වෙත දන්වා නීති උපදෙස් ලබාගත යුතු ය.**

EDR/25/CAT

# මැතිවරණ කොමිෂන් සභාව

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

| පැමිණිලි අංකය | පැමිණිලි වර්ගය |
|---|---|
| **ප්‍රචණ්ඩ ක්‍රියා** | |
| 1 | වාචිකව බිය ගැන්වීම් |
| 2 | ආයුධ පෙන්වා බිය ගැන්වීම් |
| 3 | පහරදීම්/මැර ප්‍රහාර එල්ල කිරීම |
| 4 | බරපතල තුවාල සිදු කිරීම / මිනී මැරීමට තැත් කිරීම |
| 5 | මනුෂ්‍ය ඝාතන |
| 6 | පුද්ගල පැහැරගෙන යාම් |
| 7 | කොල්ලකෑම් |
| 8 | වෙඩි තැබීම් |
| 9 | ගිනි තැබීම් |
| 10 | කෝලාහල කිරීම්/ කැරලි ගැසීම/ රැස්වීම් කඩා කප්පල් කිරීම |
| 11 | දේපළවලට හානි කිරීම්/දේපළ පැහැරගෙන යාම |
| **නීති උල්ලංඝනය** | |
| 12 | චංචල හා නිශ්චල පොදු දේපල අයතා පරිහරණය |
| 13 | රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතු වල යෙදීම |
| 14 | නිලධාරීන් පත් කිරීම/උසස්කිරීම/මාරු කිරීම/සේවා කාල දීර්ඝ කිරම/විභාග පැවැත්වීම |
| 15 | විද්‍යුත් මාධ්‍ය අවභාවිතය |
| 16 | අසත්‍ය ප්‍රචාර/ව්‍යාජ පුවත් මැවීම/වෛරී ප්‍රකාශ/අපහාස කිරීම/ජාතිවාදී ප්‍රකාශ |
| 17 | මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට බාධා කිරීම |
| 18 | නීති විරෝධී පෝස්ටර්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය කිරීම්/ අත් පත්‍රිකා බෙදා හැරීම |
| 19 | ද්‍රව්‍ය බෙදා හැරීම්/පරිත්‍යාග කිරීම්/ මුදල් පෙදා දීම්/ ඉඩම් ඔප්පු ප්‍රදානය/විවෘත කිරීම |
| 20 | රැස්වීම්/පෙළපාලි පැවත්වීම්/නීති විරෝධී දේශපාලන කාර්යාල පවත්වාගෙන යාම |
| 21 | ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම/ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන සහ ආගමික උත්සව යොදා ගැනීම |
| 22 | තැපැල් ඡන්ද වලට අදාළ පැමිණිලි |
| 23 | ඡන්ද පොළ /මැතිවරණ ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ පැමිණිලි |
| 24 | ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම |
| 25 | නීති විරෝධී උත්සව සංවිධානය |
| 26 | ඡන්ද දායකයින්ට සංග්‍රහ කිරීම |
| 27 | මැතිවරණ ප්‍රචාරක කාර්යාලවලට/ පෝස්ටර්/ බැනර් ආදියට හානි කිරීම |
| 28 | සමාජ මාධ්‍ය මගින් සිදු කරන ප්‍රචාරක කටයුතු |
| 29 | ඡන්ද පෙට්ටි ගිනි තැබීම හා බලපෑම් කිරීම |
| 30 | කාර්ය මණ්ඩලය හා නියෝජිතයන් ඡන්ද පොලෙන් පලවා හැරීම |
| 31 | ඡන්ද දායකයන් පලවා හැරීම |
| 32 | වෙනත් (පැමිණිල්ලේ ස්වාභාවය ලිවීම අනිවාර්යයි) |

EDR/25/FI

ඔබේ අංකය - EC/EDR/LAE/2025/04
මගේ අංකය -
දිනය -

මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය,
මැතිවරණ කොමිෂන් සභාව

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025**
**<u>මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම</u>**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 ට අදාළව ................................................................ දිස්ත්‍රික්කයේ මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් පහත පරිදි වේ.

1. දිස්ත්‍රික් පැමිණිලි ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය - ............................................................
   - පිහිටුවා ඇති ස්ථානය ............................................................
   - ලිපිනය - ............................................................
   - දුරකථන අංකය - ............................................................
   - ෆැක්ස් අංකය - ............................................................

2. සහකාර තේරීම්භාර නිලධාරීන්
   - නම - ............................................................
   - තනතුර - ............................................................
   - ජංගම දුරකථන අංකය (whatsapp) - ............................................................

   - නම - ............................................................
   - තනතුර - ............................................................
   - ජංගම දුරකථන අංකය(whatsapp) - ............................................................

   - නම - ............................................................
   - තනතුර - ............................................................
   - ජංගම දුරකථන අංකය(whatsapp) - ............................................................

3. ප්‍රධාන පොලිස් සම්බන්ධීකරණ නිලධාරියා
   - නම - ............................................................
   - දුරකථන අංකය - ............................................................
   - ජංගම දුරකථන අංකය - ............................................................

--------------------------
තේරීම්භාර නිලධාරී
නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/සහකාර මැතිවරණ කොමසාරිස්

.............................................දිස්ත්‍රික්කය

EDR/25/F2

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

මැතිවරණ පැමිණිලි ලබා ගැනීමේ ආකෘතිය (මහජන)

| | |
|---|---|
| පැමිණිලි අංකය | |
| පැමිණිල්ල<br>ලද ආකාරය: Tel ☐ Fax ☐ BH ☐ Ltr ☐ E-mail ☐ V ☐ W ☐ F ☐ M ☐ Web ☐ | |
| දිනය | වේලාව |
| පැමිණිලිකරුගේ නම/පක්ෂය/ස්වාධීන කණ්ඩායම.........................................................................<br>.........................................................................................................මහතා/මහත්මිය/මෙනවිය | |
| දුරකථන අංකය | |
| සිද්ධිය වූ ස්ථානය හා වේලාව | |
| දිස්ත්‍රික්කය | පොලිස් බල ප්‍රදේශය |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගම/වීදිය |
| පැමිණිල්ල හෝ චෝදනාව පිළිබඳ විස්තරය | |

**EDR/25/F3 - A**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

මැතිවරණ පැමිණිලි පැය 24 සාරාංශ වාර්තාව.................................දිස්ත්‍රික්කය

2025/..../....දින ප. ව

| අනු අංකය | පැමිණිල්ල ලද ආකාරය: Letter | Telephone | Fax | e-mail | පැමිණිල්ල ලද වේලාව | පැමිණිලිකරු | දේශපාලන පක්ෂය/ස්වාධීන කණ්ඩායම | සිද්ධිය සිදුවූ ස්ථානය/අදාළ පොලිස් බල ප්‍රදේශය | පැමිණිල්ලේ සාරාංශය | පැමිණිලි වර්ගය: ප්‍රචණ්ඩ ක්‍රියා | නීති උල්ලංඝනය | වෙනත් | පැමිණිල්ලේ ස්වාභාවය: සුළු | සාමාන්‍ය | බරපතල | ගත් ක්‍රියා මාර්ගය හා ප්‍රගතිය | පැමිණිලි කළමනාකරණ නිලධාරියාගේ නම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

| අංකය | පැමිණිලි වර්ගය |
|---|---|
| | **ප්‍රචණ්ඩ ක්‍රියා** |
| | |
| 1 | වාචිකව බිය ගැන්වීම |
| 2 | ආයුධ පෙන්වා බිය ගැන්වීම |
| 3 | පහරදීම/මැර ප්‍රහාර එල්ල කිරීම |
| 4 | බරපතල තුවාල සිදු කිරීම / මිනී මැරීමට තැත් කිරීම |
| 5 | මනුෂ්‍ය ඝාතන |
| 6 | පුද්ගල පැහැරගෙන යාම |
| 7 | කොල්ලකෑම |
| 8 | වෙඩි තැබීම |
| 9 | ගිනි තැබීම |
| 10 | කෝලහාල කිරීම/ කැරලි ගැසීම/ රැස්වීම් කඩා කප්පල් කිරීම |
| 11 | දේපළවලට හානි කිරීම/දේපළ පැහැරගෙන යාම |
| | |
| | |

| අංකය | පැමිණිලි වර්ගය |
|---|---|
| | **නීති උල්ලංඝනය** |
| 12 | චංචල හා නිශ්චල පොදු දේපළ අයතා පරිහරණය |
| 13 | රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතු වල යෙදීම |
| 14 | නිලධාරීන් පත් කිරීම/උසස්කිරීම/මාරු කිරීම/සේවා කාල දීර්ඝ කිරම/විභාග පැවැත්වීම |
| 15 | විද්‍යුත් මාධ්‍ය අවභාවිතය |
| 16 | අසත්‍ය ප්‍රචාර/ව්‍යාජ පුවත් මැවීම/වෛරී ප්‍රකාශ/අපහාස කිරීම/ජාතිවාදී ප්‍රකාශ |
| 17 | මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට බාධා කිරීම |
| 18 | නීති විරෝධී පෝස්ටර්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය කිරීම/ අත් පත්‍රිකා බෙදා හැරීම |
| 19 | ද්‍රව්‍ය බෙදා හැරීම/පරිත්‍යාග කිරීම/ මුදල් පෙදා දීම්/ ඉඩම් ඔප්පු ප්‍රදානය/විවෘත කිරීම |
| 20 | රැස්වීම්/පෙළපාලි පැවැත්වීම්/නීති විරෝධී දේශපාලන කාර්යාල පවත්වාගෙන යාම |
| 21 | ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම/ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන සහ ආගමික උත්සව යොදා ගැනීම |
| 22 | තැපැල් ඡන්ද වලට අදාළ පැමිණිලි |
| 23 | ඡන්ද පොළ /මැතිවරණ ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ පැමිණිලි |
| 24 | ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම |
| 25 | නීති විරෝධී උත්සව සංවිධානය |
| 26 | ඡන්ද දායකයින්ට සංග්‍රහ කිරීම |
| 27 | මැතිවරණ ප්‍රචාරක කාර්යාලවලට/පෝස්ටර්/බැනර් ආදියට හානි කිරීම |
| 28 | සමාජ මාධ්‍ය මගින් සිදු කරන ප්‍රචාරක කටයුතු |
| 29 | ඡන්ද පෙට්ටි ගිනි තැබීම හා බලපෑම් කිරීම |
| 30 | කාර්ය මණ්ඩලය හා නියෝජිතයන් ඡන්ද පොළෙන් පලවා හැරීම |
| 31 | ඡන්ද දායකයන් පලවා හැරීම |
| 32 | වෙනත් (පැමිණිල්ලේ ස්වාභාවය ලිවීම අනිවාර්යයි |

*පැමිණිලි වර්ගය හා එයට අදාළ අංකය සඳහන් කරන්න

.............................................. ......................................

දිනය අත්සන

# මැතිවරණ කොමිෂන් සභාව

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025

| පැමිණිලි අංකය | පැමිණිලි වර්ගය | ප්‍රවර්තන දිනය | ප්‍රවර්තන දින දක්වා | මුළු එකතුව |
|---|---|---|---|---|
| ප්‍රචණ්ඩ ක්‍රියා | | | | |
| 1 | වාචිකව බිය ගැන්වීම් | | | |
| 2 | ආයුධ පෙන්වා බිය ගැන්වීම් | | | |
| 3 | පහරදීම/මැර ප්‍රහාර එල්ල කිරීම | | | |
| 4 | බරපතල තුවාල සිදු කිරීම / මිනී මැරීමට තැත් කිරීම | | | |
| 5 | මනුෂ්‍ය ඝාතන | | | |
| 6 | පුද්ගල පැහැරගෙන යාම් | | | |
| 7 | කොල්ලකෑම් | | | |
| 8 | වෙඩි තැබීම් | | | |
| 9 | ගිනි තැබීම් | | | |
| 10 | කෝලාහල කිරීම්/ කැරලි ගැසීම/ රැස්වීම් කඩා කප්පල් කිරීම | | | |
| 11 | දේපළවලට හානි කිරීම්/දේපළ පැහැරගෙන යාම | | | |
| නීති උල්ලංඝනය | | | | |
| 12 | වංචල හා නිශ්චල පොදු දේපල අයතා පරිහරණය | | | |
| 13 | රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතු වල යෙදීම | | | |
| 14 | නිලධාරීන් පත් කිරීම/උසස්කිරීම/මාරු කිරීම/සේවා කාල දීර්ඝ කිරම/විභාග පැවැත්වීම | | | |
| 15 | විද්‍යුත් මාධ්‍ය අවභාවිතය | | | |
| 16 | අසත්‍ය ප්‍රචාර/ව්‍යාජ පුවත් මැවීම/වෛරී ප්‍රකාශ/අපහාස කිරීම/ජාතිවාදී ප්‍රකාශ | | | |
| 17 | මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට බාධා කිරීම | | | |
| 18 | නීති විරෝධී පෝස්ටර්/බැනර්/කටවුට් ප්‍රදර්ශනය කිරීම්/ අත් පත්‍රිකා බෙදා හැරීම | | | |
| 19 | ද්‍රව්‍ය බෙදා හැරීම්/පරිත්‍යාග කිරීම්/ මුදල් පෙදා දීම/ ඉඩම් ඔප්පු ප්‍රදානය/විවෘත කිරීම | | | |
| 20 | රැස්වීම්/පෙළපාලි පැවත්වීම/නීති විරෝධී දේශපාලන කාර්යාල පවත්වාගෙන යාම | | | |
| 21 | ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම/ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන සහ ආගමික උත්සව යොදා ගැනීම | | | |
| 22 | තැපැල් ඡන්ද වලට අදාළ පැමිණිලි | | | |
| 23 | ඡන්ද පොළ /මැතිවරණ ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ පැමිණිලි | | | |
| 24 | ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම | | | |
| 25 | නීති විරෝධී උත්සව සංවිධානය | | | |
| 26 | ඡන්ද දායකයින්ට සංග්‍රහ කිරීම | | | |
| 27 | මැතිවරණ ප්‍රචාරක කාර්යාලවලට/ පෝස්ටර්/ බැනර් ආදියට හානි කිරීම | | | |
| 28 | සමාජ මාධ්‍ය මගින් සිදු කරන ප්‍රචාරක කටයුතු | | | |
| 29 | ඡන්ද පෙට්ටි ගිනි තැබීම හා බලපෑම් කිරීම | | | |
| 30 | කාර්ය මණ්ඩලය හා නියෝජිතයන් ඡන්ද පොලෙන් පලවා හැරීම | | | |
| 31 | ඡන්ද දායකයන් පලවා හැරීම | | | |
| 32 | වෙනත් (පැමිණිල්ලේ ස්වාභාවය ලිවීම අනිවාර්යයි) | | | |
| එකතුව | | | | |

EDR/25/F4

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு
## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

මැතිවරණ පැමිණිලි ලබා ගැනිමේ ආකෘතිය (නීති උල්ලංඝනය)

| | |
|---|---|
| පැමිණිලි අංකය | |
| පැමිණිල්ල ලද ආකාරය | Tel ☐ Fax ☐ BH ☐ Ltr ☐ E-mail ☐ V ☐ W ☐ F ☐ M ☐ Web ☐ |
| දිනය | වේලාව |
| පැමිණිලිකරුගේ නම/පක්ෂය/ස්වාධීන කණ්ඩායම........................................................................ ..........................................................................................................මහතා/මහත්මිය/මෙනවිය | |
| දුරකථන අංකය | |
| සිද්ධිය වූ ස්ථානය හා වේලාව | |
| දිස්ත්‍රික්කය | පොලිස් බල ප්‍රදේශය |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගම/වීදිය |
| පැමිණිල්ල හෝ චෝදනාව පිළිබඳ විස්තරය | |

| | | | |
|---|---|---|---|
| පැමිණිලි වර්ගය:- | | | පැමිණිලි අංකය ☐ |
| *පැමිණිල්ලේ ස්වභාවය | සුළු 1 2 3 | සාමාන්‍ය 4 5 6 7 | බරපතල 8 9 10 |
| *පැමිණිල්ල ලැබෙන අවස්ථාව වන විට එම පැමිණිල්ල මැතිවරණය සඳහා කොතරම් බලපාන්නේද යන්න | | | |
| උපදෙස් | පැමිණිල්ල යොමු කරන ලදී | | යොමුකළ දිනය හා වේලාව |
| | පොලිසිය | දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය | |

පොලිස් මැතිවරණ ඒකකය-නියෝජ්‍ය පොලිස්පති/නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්/දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය

අත්සන:-

| | | |
|---|---|---|
| පිළිතුරු ලැබී ඇත | පොලිස් ඔව් ☐ නැත ☐ | දි.මැ.කා ඔව් ☐ නැත ☐ |

EDR/25/F5

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு
## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

මැතිවරණ පැමිණිලි ලබා ගැනීමේ ආකෘතිය (ප්‍රචණ්ඩ ක්‍රියා)

| | |
|---|---|
| පැමිණිලි අංකය | |

පැමිණිල්ල ලද ආකාරය Tel ☐ Fax ☐ BH ☐ Ltr ☐ E-mail ☐ V ☐ W ☐ F ☐ M ☐ Web ☐

| | |
|---|---|
| දිනය | වේලාව |

පැමිණිලිකරුගේ නම/පක්ෂය/ස්වාධීන කණ්ඩායම........................................................................................
..........................................................................................................මහතා/මහත්මිය/මෙනවිය

දුරකථන අංකය

සිද්ධිය වූ ස්ථානය හා වේලාව

| | |
|---|---|
| දිස්ත්‍රික්කය | පොලිස් බල ප්‍රදේශය |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ගම/වීදිය |

පැමිණිල්ල හෝ චෝදනාව පිළිබඳ විස්තරය

| | | | |
|---|---|---|---|
| පැමිණිලි වර්ගය:- | | | පැමිණිලි අංකය ☐ |
| *පැමිණිල්ලේ ස්වාභාවය | සුළු 1 2 3 | සාමාන්‍ය 4 5 6 7 | බරපතල 8 9 10 |

*පැමිණිල්ල ලැබෙන අවස්ථාව වන විට එම පැමිණිල්ල මැතිවරණය සඳහා කොතරම් බලපාන්නේද යන්න

| | | | |
|---|---|---|---|
| උපදෙස් | පැමිණිල්ල යොමු කරන ලදී | | යොමුකළ දිනය හා වේලාව |
| | පොලිසිය | දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය | |

පොලිස් මැතිවරණ ඒකකය-නියෝජ්‍ය පොලිස්පති/නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්/දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය

අත්සන:-

| | | | | |
|---|---|---|---|---|
| පිළිතුරු ලැබී ඇත | පොලිස් ඔව් ☐ | නැත ☐ | දි.මැ.කා ඔව් ☐ | නැත ☐ |

අනෙක් පිටුව පිරවීම අත්‍යාවශ්‍යයි

| | |
|---|---|
| 1 | පැමිණිල්ලේ ස්වාභාවය සම්බන්දයෙන් පැමිණිලි ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයේ විස්තරය: |
| 2 | පොලිස් වාර්තාව ( පොලිස් වාර්තා අංකය/B වාර්තාව/නඩු ගොනු අංකය/නඩුව පවතින වාර්තාව): |
| 3 | මෙමගින් මැතිවරණ කටයුතු සඳහා සිදුවන වාර්තා සම්බන්ධයෙන් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්/සහාකාර මැතිවරණ කොමසාරිස් නිරීක්ෂණය: |
| 4 | ජාතික මැතිවරණ පැමිණිලි ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන ප්‍රධානියාගේ නිර්දේශය: |
| 5 | මැතිවරණ කොමිෂන් සභාවේ නියමය: |